දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු චක්‍රලේඛ 02/2025

මගේ අංකය : PD/S/DAPH/AO/EST-43-3

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,

නූපේ,

මාතර.

2026.01. 16

අතිරේක පළාත් අධ්‍යක්ෂ/ විෂය විශේෂඥ

නියෝජ්‍ය අධ්‍යක්ෂ - පළාත් කාර්යාලය/ ගාල්ල/ මාතර/ හම්බන්තොට,

සියලු පශු වෛද්‍ය නිලධාරීන්/ සත්ත්ව පාලන නිලධාරීන්

ස්ථානභාර නිලධාරීන් - සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානය,

ස්ථාන භාර නිලධාරී - කැකණඳුර ගොවිපොළ.

<u>රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් සතුන්ට ප්‍රතිකාර කිරීම.</u>

උක්ත කරුණට අදාළව පේරාදෙණිය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජෙනරාල්ගේ 2024/09/20 දිනැති 09/2024 චක්‍රලේඛය සංශෝධන සහිතව දකුණු පළාතට අදාළ කර ගැනීම සඳහා මෙම පළාත් චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

**01. රාජකාරී වේලාවන් තුළ ප්‍රතිකාර කිරීම**

රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් රජයේ පශු වෛද්‍ය කාර්යාල හෝ පශු රෝහල් වල දිස්පැන්සරියේ හෝ ක්ෂේත්‍රයේ සේවා සැපයීමේ දී සත්ත්ව රෝග සඳහා ප්‍රතිකාර කිරීම, රෝග නිවාරණය , රෝග වැළැක්වීම, ශල්‍යකර්ම සිදු කිරීම, මරණ පරීක්ෂණ සිදු කිරීම, රෝග විනිශ්චය සඳහා රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබා ගැනීම වැනි කරුණු සඳහා අයකළ යුතු සේවා ගාස්තු පහත සඳහන් වේ.

**2.1 කෘෂිකාර්මික සතුන් සඳහා**

රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් කෘෂිකාර්මික සතුන් සඳහා රාජකාරී වේලාවන් තුළ කාර්යාලයේ දී හෝ ජංගම සායනයේ දී හෝ ක්ෂේත්‍රයේ දී ප්‍රතිකාර කිරීමේ දී, සත්ත්ව රෝග පනතේ (1992 අංක 59 දරණ සත්ව රෝග පනත) උපලේඛනගත රෝග නිවාරණ එන්නත් ලබා දීමේ දී වෘත්තිමය හෝ උපදේශක ගාස්තු වශයෙන් කිසිදු සේවා ගාස්තු අය කිරීමක් සිදු නොකළ යුතු ය. එහෙත් මරණ පරීක්ෂණ ගාස්තු හෝ රසායනාගාර ගාස්තු අයකළ හැකිය.

**2.2. කෘෂිකාර්මික නොවන සතුන් සඳහා**

රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් සුරතල් සතුන්ට ප්‍රතිකාර කරන වේලාව පහත පරිදි වේ.

| | |
|---|---|
| සතියේ දින | - පෙ.ව. 8.30 - පෙ.ව. 10.30 දක්වා |
| සෙනසුරාදා දින | - පෙ.ව.8.30 - ප.ව. 12.15 දක්වා |

රජයේ පශු වෛද්‍ය නිලධාරියෙක් විසින් පශු වෛද්‍ය කාර්යාලයේ දී හෝ පශු රෝහලකදී රාජකාරී වේලාවන් තුළ කෘෂිකාර්මික නොවන සතුන්ගේ රෝග පරීක්ෂාව, නිවාරණය, නිවාරණය සහ ප්‍රතිකාර කිරීම වෙනුවෙන් පහත සඳහන් පරිදි සේවා ගාස්තු අයකළ යුතුය.

I. උපදේශන ගාස්තු අය කිරීම ( සතෙකු සඳහා)

| | | |
|---|---|---|
| II | නොමුහුන් සුනඛයින්/ බළලුන් | රු.300.00 |
| III | දෙමුහුන් සුනඛයින්/ බළලුන් | රු.150.00 |
| IV | සුරතලයට ඇති කරන පක්ෂීන් | රු. 300.00 |
| V | අශ්වයින් සහ පෝනින් | රු. 1000.00 |
| VI | අලි ඇතුන් | රු.2000.00 |
| VII | අනෙකුත් කෘෂිකාර්මික සතුන් | රු. 200.00 |
| VIII | සුරතල් මත්ස්‍යයින් | රු. 200.00 |
| IX | සුරතල් සතුන් සඳහා සෞඛ්‍ය සහතික නිකුත් කිරීම | රු. 1000.00 |
| X | බෙහෙත් වට්ටෝරුවක පමණක් නිකුත් කිරීම | රු.100.00 |

ii. නිවාරණ එන්නත් ලබා දීමේ දී සේවා ගාස්තුව - රු.100.00

iii. ශල්‍යකර්ම සේවා ගාස්තුව (සතෙකුට)

| | | |
|---|---|---|
| a. | Surgical Sterilization/ Castration- Dogs | රු. 2000.00 |
| b. | Surgical Sterilization/ Castration- Cats | රු.1500.00 |
| c. | Cosmetic Surgery | රු. 700.00 |
| d. | Non Invasive surgery without anesthesia | රු.700.00 |
| e. | Invasive surgeries under anesthesia | රු. 2000.00 |
| f. | Wound dressing | රු. 500.00 |
| g. | Removal of sutures, pops, Dressing W/O anesthesia | රු. 300.00 |
| h. | Collection of tissue sample | රු.200.00 |

2.3. රාජකාරී ඉටු කිරීමේ දි මරණ පරීක්ෂණ සඳහා ගාස්තු අය කිරීම (සතෙකුට)

| | සත්ත්ව වර්ගය | ඒකක ගාස්තුව |
|---|---|---|
| I | Poultry | රු. 100.00 |
| II | Small Ruminants | රු.500.00 |
| III | Swine | රු.500.00 |
| IV | Rabbit | රු. 500.00 |
| V | Large Ruminant | රු. 1000.00 |
| VI | Nonagricultural animals | රු.500.00 |

**2.4. රසායනාගාර ගාස්තු අය කිරීම**

ඒ සඳහා දෙපාර්තමේන්තු අනුමත මිල ගණන් භාවිතා කළ යුතුයි. ( 2023.03.23 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 03/2023/DAPH/AD/16/02/06)

**2.5.නේවාසික ගාස්තු අය කිරීම**

1. රජයේ පශු වෛද්‍ය නිලධාරින් විසින් ඉටු කරන ඕනෑම ප්‍රතිකාර කිරීමක දී කෘෂිකාර්මික නොවන හෝ සුරතල් සතුන් සඳහා ඖෂධ, එන්නත්, රෝග විනිශ්චය යෙදවුම් සහ වෙනත් යෙදවුම් සඳහා නියම කර ඇති මිල ගණන් හා ගාස්තු පිළිබඳ නිර්දේශ ලබා ගැනීමට අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරන ලද නිලධාරීන් ඇතුළත් කමිටුවක් පත් කළ යුතු ය. එම කමිටුව මාස 03 කට වරක් රැස්විය යුතු අතර එම කමිටුව මගින් නිර්දේශිත මිල ගණන් පමණක් සේවාදායකයාගෙන් අයකර ගත යුතුයි. එහි දී කිසියම් ගාස්තු සංශෝධනයක් සිදු වන්නේ නම් ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය ලබා ගෙන දකුණු පළාත තුළ ක්‍රියාත්මක කළ යුතුය.

2. කෘෂිකර්මික සතුන් සඳහා යොදා ගන්නා ඖෂධ, එන්නත්, රෝග විනිශ්චය යෙදවුම් සහ වෙනත් යෙදවුම් සඳහා සේවා ලාභියාගෙන් මුදල් අයකරනු නොලබන අතර එම ප්‍රතිකාර සම්පූර්ණයෙන් ම නොමිලේ සිදු කෙරේ.

3. මෙම සේවා ගාස්තු වලට අමතරව රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් ඉටු කෙරෙන ඕනෑම ප්‍රතිකාර කිරීමකදී කෘෂිකාර්මික නොවන හෝ සුරතල් සතුන් සඳහා යොදා ගන්නා ඖෂධ, එන්නත්, රෝග විනිශ්චය යෙදවුම් සහ වෙනත් යෙදවුම් සඳහා නියම කර ඇති මිල ගණන් පමණක් සේවා ලාභියාගෙන් අයකළ යුතුය.

4. රජයේ පශු වෛද්‍ය නිලධාරියෙකු විසින් රාජකාරී වේලාවන් තුළ ඉටු කරනු ලබන ඉහත ප්‍රතිකාර ක්‍රම සම්බන්ධයෙන් අදාළ ගාස්තු අයකර ඒ සඳහා පළාත් සභාව විසින් ලබා දී ඇති මුදල් භාර ගැනීමේ කුවිතාන්සියක්/ රිසිට් පතක් අනිවාර්යෙන්ම නිකුත් කළ යුතු ය. එම මුලද නිශ්චිත වූ රජයේ ආදායම් ගිණුමට බැර කළ යුතු ය.

5. රාජකාරී වේලාවෙන් පරිබාහිර, සතුන්ට ප්‍රතිකාර කිරීම සඳහා පුද්ගලික සේවයේ යෙදීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයෙහි XXX වැනි පරිච්ඡේදයෙහි 1.5 වගන්තිය අදාළ කරගත යුතු වේ.

6. රාජකාරී වේලාවෙන් පරිබාහිරව කෘෂිකාර්මික නොවන හෝ සුරතල් සතුන්ට ප්‍රතිකාර කිරීමේ දී පශු වෛද්‍ය නිලධාරියෙකු විසින් කාර්යාල පරිශ්‍රය හෝ රජයේ කිසිදු දේපළක් හෝ ඖෂධ හෝ උපකරණ හෝ භාවිතයට ගැනීම නොකළ යුතු ය.

අර්ථ දැක්වීම:

කෘෂිකාර්මික සතුන් - වාණිජමය පරමාර්ථයෙන් නිවසේ හෝ ගොවිපලවල ඇති කරන සතුන්
උදා: ගවයින්, එළුවන්, සූකර, කුකුළන්, ජලජ ජීවීන් වැනි

සුරතල් සතුන් - මිනිසා සමග මිත්‍රශීලී වාසය සඳහා ඇති කරන සතුන්
උදා: බල්ලා, බළලා, පක්ෂීන්, ජලජ ජීවීන් වැනි

කේ.එල්.කේ.එස්.පෙරේරා
පළාත් අධ්‍යක්ෂ (දකුණ)

වෛද්‍ය කේ. එල්. කේ. එස්. පෙරේරා
පළාත් අධ්‍යක්ෂ (දකුණ)
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
නූපේ - මාතර.

පිටපත්:

01.ප්‍රධාන ලේකම් - දකුණු පළාත

02.ලේකම් - ධීවර හා සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශය, දකුණු පළාත